සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 12 - 2019

විභාග අංකය ..... නර්තනය I කාලය පැය දෙකයි

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

I කොටස

- **අංක 01 සිට 25 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුල ලියන්න.**

01. උඩරට නර්තන සම්ප්‍රදායේ අටවෙනි පා සරඹය හා නවවෙනි ගොඩ සරඹය හඳුන්වනු ලබන නාම වන්නේ,
    1. කරණම් අඩිය හා අර්ධ චක්‍ර සරඹය යනුවෙනි.
    2. කරණම් අඩිය හා දෑත පැගීමේ සරඹය යනුවෙනි.
    3. කරණම් අඩිය හා දෙපැති අඩිය යනුවෙනි.
    4. අර්ධ චක්‍ර සරඹය හා දෑත පැගීමේ සරඹය යනුවෙනි.
    5. අර්ධ චක්‍ර සරඹය හා කරණම් අඩිය යනුවෙනි. (.....)

02. පහතරට නර්තන සම්ප්‍රදායෙහි දක්නට ලැබෙන සරල පිනුම් විශේෂ දෙකකි.
    1. ආසුව සහ පතහවිස්ස 2. ආසුව සහ මාලක්කම 3. පතහ විස්ස සහ බඹර වළල්ල
    4. බඹර වළල්ල සහ මාලක්කම 5. මාලක්කම සහ පහත විස්ස. (.....)

03. මුසලඩි වන්නම නර්තනය කරනු ලබන්නේ,
    1. මාත්‍රා 3+4 හා මාත්‍රා 4+4 තාල රූපයටය.
    2. මාත්‍රා 2+4 හා මාත්‍රා 3+3 තාල රූපයටය.
    3. මාත්‍රා 3+4 හා මාත්‍රා 3+3 තාල රූපයටය.
    4. මාත්‍රා 2+3 හා මාත්‍රා 3+3 තාල රූපයටය.
    5. මාත්‍රා 3+4 හා මාත්‍රා 2+2 තාල රූපයටය. (.....)

04. මාත්‍රා 2+2+4 තුන් තිතේ තාල රූපයට නර්තනය කළ හැකි වට්ටමකි.
    1. කුද කුජිගත වට්ටම 2. දොංජිංත ගත දොංත වට්ටම
    3. ගොග් ගොග් පිං පිං ගත වට්ටම 4. දොගොර ජිං ගජිං ගජිගත වට්ටම
    5. කුදංත ගත දොං වට්ටම (.....)

05. ''තාක්කු තක ජිජිකුද දොහොකඩ තහකඩ තකජිජිකුද කිතක්කු තක ජිජිකුද දෝං තා'' මෙය,
    1. මාත්‍රා 3+4 ට නර්තනය කලහැකි අඩව්වකි. 2. මාත්‍රා 2+3 ට නර්තනය කලහැකි අඩව්වකි.
    3. මාත්‍රා 2+2+4 ට නර්තනය කලහැකි අඩව්වකි. 4. මාත්‍රා 2+2+3 ට නර්තනය කලහැකි අඩව්වකි.
    5. මාත්‍රා 2+ 4 ට නර්තනය කලහැකි අඩව්වකි. (.....)

06. සිංහල නර්තන සම්ප්‍රදායන් තුනෙහි පා සරඹ හා මණ්ඩිපද නැටීමෙන් පසු ආධුනිකයෙකු අභ්‍යාස කල යුතු වන්නේ,
    1. ගොඩ සරඹ, මංගලම් සහ මාත්‍රා පහය. 2. ගොඩ සරඹ, ඉලංගම් සරඹ සහ වට්ටම්ය.
    3. මංගලම්, වට්ටම් සහ මාත්‍රා පහය. 4. ගොඩ සරඹ, ඉලංගම් සරඹ සහ දොඹින පදය.
    5. ඉලංගම් සරඹ, මාත්‍රා පහ සහ වට්ටම්ය. (.....)

07. බෞද්ධාගමිකවත් පිළිවෙත් සඳහා සෘජුවම සම්බන්ධවන අවනද්ධ භාණ්ඩ නම්,
1. දවුල, තම්මැට්ටම හා ගැටබෙරය වේ.
2. දවුල, තම්මැට්ටම හා හොරණෑව වේ.
3. ගැටබෙරය, තම්මැට්ටම හා හොරණෑව වේ.
4. දවුල, ගැටබෙරය හා යක්බෙරය වේ.
5. දවුල, තම්මැට්ටම හා සෝෂකබෙරය වේ. (.....)

08. ''සුර සමඟ එක් උණ - සිටුවා නොයෙක් ලක්ෂණ'' මෙම කවි පද වලින් කියැවෙන්නේ,
1. ගැටබෙර උපත පිළිබඳවය.
2. පහතරට බෙරයේ උපත පිළිබඳවය.
3. දවුලේ උපත පිළිබඳවය.
4. තම්මැට්ටමේ උපත පිළිබඳවය.
5. උඩැක්කියේ උපත පිළිබඳවය. (.....)

09. ''තකට කුඳට'', ''කිටිතක දොම්කිට'' යන බෙරපද අයත් නර්තන සම්ප්‍රදායන් වන්නේ,
1. උඩරට හා පහතරට
2. පහතරට හා සබරගමු
3. උඩරට හා සබරගමු
4. සබරගමු හා උඩරට
5. පහතරට හා උඩරට (.....)

10. ගැටබෙරයේ හා දෙවොල් බෙරයේ භාවිතා කරන වරපටෙහි දිග වනුයේ,
1. සත් බඹ තුන් වියතකි.
2. සත් බඹ සත් වියතකි.
3. සත් බඹ අට වියතකි.
4. සත් බඹ සිව් වියතකි.
5. සත් බඹ එක් වියතකි. (.....)

11. දළදා පෙරහැර අවසන්වීමෙන් පසු වලියක් මංගල්‍ය පවත්වනු ලබන්නේ,
1. මහා විෂ්ණු දේවාලයේදීය.
2. මහා සමන් දේවාලයේදීය.
3. පත්තිනි දේවාලයේදීය.
4. දළදා මාළිගාවේදීය.
5. කතරගම දේවාලයේදීය. (.....)

12. මංගලම් නර්තන අංගයේ බෙර පාදය වාදනය කළ හැකි තිත් රූපය වනුයේ,
1. දෙසුළු මහ තුන්තිතය.
2. තුන්සුළු මහා සිව්තිතය.
3. දෙසුළු මැදුම් තුන්තිතය.
4. තුන්සුළු දෙමහ පස්තිතය.
5. මැදුම් තනිතිතය. (.....)

13. ''වැල්ලකර බෙරය, කිඳුරු බෙරය'' යන නම් වලින් හඳුන්වනු ලබන්නේ,
1. ගැටබෙරය ය.
2. මඟුල් බෙරය ය.
3. දෙවොල් බෙරය ය.
4. දවුල් බෙරය ය.
5. තම්මැට්ටම ය. (.....)

14. ''යස ඉසුරු සුලබා - සිරි ලකෙහි යුත් ගජබා'' මෙය,
1. මඩුපුරයේ කවියකි.
2. කුවේණි අස්නේ කවියකි.
3. කොහොඹා හැල්ලේ කවියකි.
4. නානුමුරයේ කවියකි.
5. ග්‍රහ පන්ති කවියකි. (.....)

15. කොහොඹාහැල්ලේ කවි, නානුමුරයේ කවි, ග්‍රහපන්ති කවි ඇතුලත් ශාන්ති කර්ම පිළිවෙල වන්නේ,
1. කොහොඹා කංකාරිය, රට යකුම හා බලියාගය ය.
2. රට යකුම, බලියාගය හා කොහොඹා කංකාරිය ය.
3. රට යකුම, දෙවොල්මඩුව හා බලියාගය ය.
4. කොහොඹා කංකාරිය, දෙවොල්මඩුව හා බලියාගය ය.
5. කොහොඹා කංකාරිය, රිද්දියාගය හා දෙවොල්මඩුව ය. (.....)

16. වලියක් මංගල්‍යයේ පූජාචාරිත්‍ර අනුව තෙවන දින එය ආරම්භ කරන හා අවසන් කරන වේලාව වන්නේ පිළිවෙලින්,
1. පෙ.ව. 6.00ට සහ රාත්‍රී 12.00 ටය.
2. ප.ව. 7.00ට සහ රාත්‍රී 9.00 ටය.
3. ප.ව. 7.30ට සහ රාත්‍රී 10.30 ටය.
4. ප.ව. 7.30ට සහ රාත්‍රී 10.00 ටය.
5. ප.ව. 8.30ට සහ රාත්‍රී 10.30 ටය. (.....)

17. වළියකුම ශාන්ති කර්මයෙහි රඟ දැක්වෙන නාට්‍යමය ලක්ෂණ ඇතුලත් පෙළපාලි වන්නේ,
1. වැදි යක්කම, උෆරා යක්කම හා සීතා යක්කම
2. වැදි යක්කම, උෆරා යක්කම හා නයායක්කම
3. වැදි යක්කම, මහ යක්කම හා උෆරා යක්කම
4. උෆරා යක්කම, සීතා යක්කම හා මහ යක්කම
5. වැදියක්කම, නයා යක්කම හා මහ යක්කම. (.....)

18. දේශීය අමුද්‍රව්‍ය යොදාගත් ආලේපන වලින් මුහුණ වෙස් ගන්වා සභාවට පිවිසෙන්නේ,
1. කණ සන්නිය
2. වෙඩි සන්නිය
3. මරු සන්නිය
4. බිහිරි සන්නිය
5. ගොළු සන්නිය (.....)

19. ''දෝං ජිංජිං තකට දොංතක'' දොංත ගුදම් ගත ගදිත ගතම් ජිම්තක්කිට තකට ජිම්තකු, යන බෙර පද අයත් වන්නේ,
1. මාත්‍රා 2+4 දෙතිතේ තාල රූපයටය.
2. මාත්‍රා 2+3 දෙතිතේ තාල රූපයටය.
3. මාත්‍රා 3+4 දෙතිතේ තාල රූපයටය.
4. මාත්‍රා 2+2+3 තුන්තිතේ තාල රූපයටය.
5. මාත්‍රා 2+2+4 තුන්තිතේ තාල රූපයටය. (.....)

20. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ සියලුම යක්දෙස්සන් හා බෙර වාදකයින් සහභාගිවන දෙවන නර්තන අංගය වන්නේ,
    1. යක්කැන්නුමය. 2. ආවැන්දුමය. 3. කොහොඹා හැල්ලය.
    4. අස්නෙය. 5. මඩුපුරයය. (.....)

21. නර්තන ඉතිහාසය හා සම්බන්ධ තොරතුරු ලබාගත හැකි සෙල්ලිපි වන්නේ,
    1. සැස්සේරුව, කොරවක්ගල හා පාල මොට්ටෙයි
    2. සැස්සේරුව, වල්ලිපුරම් හා කොරවක්ගල
    3. කොරවක්ගල, පාල මොට්ටෙයි හා නීලගම
    4. සැස්සේරුව, නීලගම හා පාලමොට්ටෙයි
    5. නාගිරිකන්ද, නීලගම හා පාලමොට්ටෙයි (.....)

22. ආංගික අභිනයේදී උපාංග කොටසට අයත් වන්නේ,
    1. හිස, ගෙල, ඇහිබැම, නාසය 2. අත්, පා, උකුල, දණහිස
    3. ඇහිබැම, තොල්, ඇස් කම්මුල් 4. හිස, පපුව, ඉණ, දණහිස
    5. දෙඅත්, ගෙල, ඇහිබැම, නාසය (.....)

23. ''අනේ මලනි දුටොත් කියන්'' මෙහි ලඝු හා ගුරු අක්ෂර ගණන වන්නේ,
    1. ලඝු 06, ගුරු 02 කි. 2. ලඝු 06, ගුරු 03 කි. 3. ලඝු 05, ගුරු 02 කි.
    4. ලඝු 05, ගුරු 04 කි. 5. ලඝු 06, ගුරු 01 කි. (.....)

24. ''ඉන්දු දිශාවට ඉඹුල් විමානෙට'' යන කවියෙන් කියැවෙන්නේ,
    1. බුධ ග්‍රහයා පිළිබඳවය. 2. කුජ ග්‍රහයා පිළිබඳවය. 3. සෙනසුරු ග්‍රහයා පිළිබඳවය.
    4. සිකුරු ග්‍රහයා පිළිබඳවය. 5. හිරු ග්‍රහයා පිළිබඳවය. (.....)

25. උඩරට නර්තන ශිල්පියා දෙඋර, පපුව හා අතෙහි මැණික් කටුවට පළඳිනු ලබන ආභරණ පිළිවෙල වනුයේ,
    1. උරබාහු, කෙමෙන්ත හා අවුල්හැරය ය.
    2. කෙමෙන්ත, අවුල්හැරය හා බන්දි වළලු ය.
    3. බන්දි වළලු, අවුල්හැරය හා කෙමෙන්ත ය.
    4. උරබාහු, අවුල්හැරය හා කෙමෙන්ත ය.
    5. අවුල්හැරය, නෙත්තිමාලය හා කෙමෙන්ත ය. (.....)

- **26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාල පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. බලි ශාන්ති කර්මයේදී තාල වාද්‍ය භාණ්ඩය ලෙස ..... භාවිතා කරයි.

27. විලම්භ ලය ..... ලෙස ද හැඳින්වේ.

28. තත් දිත් තොං නං යනු ..... බෙරයෙන් වැයෙන සතර බීජාක්ෂර වේ.

29. ගැටබෙරයේ දකුණු ඇසෙහි බෙර කට වටේ සකස් කරගන්නා වූ කුඩා රේඛාව ..... ලෙස හැඳින්වේ.

30. ''වලියක් මංගල්‍ය විමසුම'' ..... විසින් රචනා කරන ලද ග්‍රන්ථයකි.

31. බෙර වාදනයට පිවිසෙන ආධුනිකයාට ගුරුවරයා විසින් ආශීර්වාදය පතා සරඹ වාදනයට ප්‍රථමයෙන් ..... වාදනය කිරීම පාරම්පරික සිරිතකි.

32. රට යකුමේ නානුමුරය බෙන්තර සම්ප්‍රදායේ දී ..... නමින් හඳුන්වයි.

33. උඩැක්කියේ හඬ සුසර කර ගැනීම සඳහා ..... යොදා ගනී.

34. ''ඉන්දු දිගේ රවි දෙවිඳුට - වැන්දෙමි අවසර ගන්නට'' මෙය ..... තාලයට ගායනා කරයි.

35. වළියක් මංගල්‍යයේ දී ගරා යකුම නැටීම ..... කුලයේ අය විසින් කළ යුතු රාජකාරියකි.

- **ප්‍රශ්න අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තිත් ඉර මත ලියන්න.**

36. පහතරට සම්ප්‍රදායේ දෙඅත්ල පොලොව මත තබා පිණුම් ගැසීම හා දෙඅත්ල පොලොව මත නොතබා පිණුම් ගැසීම හා හඳුන්වන නාම වන්නේ,
    1. දෙඅත්ල පොලොව මත තබා - .....
    2. දෙඅත්ල පොලොව මත නොතබා - .....

37. අංග රචනයේ දී ''ඇස් පිහාටු හා දත් වර්ණ ගැන්වීම සඳහා භාවිත ද්‍රව්‍ය නම් කරන්න.
    1. ඇස් පිහාටු - .....
    2. දත් - .....

38. සාම්ප්‍රදායික ශිල්පියා අංග රචනය සඳහා භාවිතා කළ දේශීය අමුද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
    1. ..... 2. .....

39. ''මඩු පුරය'' නැටීමේදී පුද ලබන දෙවියන් සහ භාවිතා කරන පූජා භාණ්ඩය නම් කරන්න.
    1. දෙවියන් - .....
    2. පූජා භාණ්ඩය - .....

40. ''දොංත තදොං තදොං රුදග ජීං'' මෙම බෙර පදය අයත් නර්තන අංගය හා නර්තනය කල හැකි තාල රූපය සඳහන් කරන්න.
    1. නර්තන අංගය - .....
    2. තාල රූපය - .....

41. වළියක් මංගල්‍යයේ යක්දෙස්සන්ගේ ඇඳුම් කට්ටලය හා හිස් පළඳනාව නම් කරන්න.
    1. ඇඳුම් කට්ටලය - .....
    2. හිස් පළඳනාව - .....

42. වළියකුම ශාන්තිකර්මය නර්තනය කිරීමට හිමිකම් ලබා ඇති පරම්පරා දෙක නම් කරන්න.
    1. ..... 2. .....

43. ''කඩ තරිකිට කුංදාං කඩතක'' මෙම අඩවිව අයත් වට්ටම සහ නර්තනය කලහැකි තාල රූපය නම් කරන්න.
    1. වට්ටම - ..... 2. තාල රූපය - .....

44. ''රොබට් නොක්ස්'' සහ ''ඉබන් බතූතා'' යන දේශාටන වාර්තාකරුවන් සඳහන් වන යුග වන්නේ,
    1. රොබට් නොක්ස් - ..... 2. ඉබන් බතූතා - .....

45. ''සියොපත් පතිනේ - දිගු නුව නෙතිනේ'' මෙම ගී පද ඇතුලත් ශාන්තිකර්මය හා නර්තන අංගය නම් කරන්න.
    1. ශාන්ති කර්මය - .....
    2. නර්තන අංගය - .....

46. රන් තෙලඹුවේ කවි සහ එරන්දතී වර්ණනාව යොදා නිර්මාණය වී ඇති ගැමි නැටම් දෙකක් නම් කරන්න.
    1. රන් තෙලඹුවේව කවි - .....
    2. එරන්දතී වර්ණනාව - .....

47. ''නාට්‍ය ශාස්ත්‍රය'' සහ ''අභිනය දර්පනය'' යන භාරතීය සාහිත්‍ය කෘති රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද ?
    1. නාට්‍ය ශාස්ත්‍රය - ..... 2. අභිනය දර්පනය - .....

48. ශුද්ධ මාත්‍රය හා මුල් මාත්‍රය ඇතුලත් නර්තන සම්ප්‍රදායන් දෙක නම් කරන්න.
    1. ශුද්ධ මාත්‍රය - ..... 2. මුල් මාත්‍රය - .....

49. ''වීර'' හා රෞද්‍ර රසයන්හි භාව නම් කරන්න.
    1. වීර - ..... 2. රෞද්‍ර - .....

50. නර්තනය හා සංගීතයේ මූලික මාධ්‍යයන් නම් කරන්න.
    1. නර්තනය - ..... 2. සංගීතය - .....

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

52	S	II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

First Term Test - Grade 12 - 2019

විභාග අංකය .....

නර්තනය II

කාලය පැය දෙකයි

- **I වන කොටසේ ප්‍රශ්න අංක 01 හා 02 අනිවාර්යයේ. II හා III කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වන සේ ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **සෑම ප්‍රශ්නයකම I කොටසට ලකුණු (06) ක් ද II කොටසට ලකුණු (06) ක් ද III කොටසට ලකුණු (08) ක් ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමි වේ.**

I කොටස

01. i. මංගලම් නර්තන අංගයට අයත් බෙර පදය අදාල තාල රූපයට ප්‍රස්තාර කරන්න.
    ii. පහත සඳහන් කවි පද දෙක අදාල තිත්රූපයට අනුව ප්‍රස්තාර කරන්න.
    ''සිරිවස ගෙන අසූ නැගෙමින් නොලෙසා
    සිරි බර ඉඹුලේ තුරු රැස නිවෙසා''
    iii. මුසලඩි වන්නමේ අඩවිව ප්‍රස්තාර කරන්න.

02. නර්තන කලාවේ ප්‍රභවය හා විකාශනයට විවිධ සාධක හේතුවූ බව ඓතිහාසික තොරතුරුවලින් විද්‍යාමාන වේ.
    i. නර්තන කලාවේ ප්‍රභවයට බලපෑ ජීව විද්‍යාත්මක සාධක කෙටියෙන් හඳුන්වන්න.
    ii. ආගමික වශයෙන් මානව අවශ්‍යතා සඳහා නර්තනය යොදාගත් බවට කරුණු පැහැදිලි කරන්න.
    iii. ආදී මානවයා සාමාජීය අවශ්‍යතා සඳහා නර්තනය යොදාගත් ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

II කොටස

03. සමාජයේ යහ පැවැත්ම උදෙසා විවිධ වූ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට ශාන්ති කර්ම පවත්වනු ලැබේ.
    i. වලියක් මංගල්‍යය පැවැත්වීමේ පරමාර්ථ පිළිබඳ විමසුමක් කරන්න.
    ii. එම ශාන්තිකර්මය හා සබැඳි සුවිශේෂී සැරසිලි අවස්ථා දෙකක් පිළිබඳ විස්තර කරන්න.
    iii. සමාජ සම්බන්ධතා හා සාරධර්ම එදිනෙදා ජීවිතය හා බැඳෙන ආකාරය වලියකුම ශාන්ති කර්මය ඇසුරින් පැහැදිලි කරන්න.

04. දේශීය ශාන්තිකර්ම ගායන, වාදන, නර්තන අංග වලින් පරිපූර්ණ වේ.
    i. කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ ගායනා සහිත නර්තන අංග තුනක් නම් කර එක් නර්තන අංගයක් පිළිබඳ විමසුමක් කරන්න.
    ii. බලි ශාන්ති කර්මයට අයත් සුවිශේෂී ගායනා ක්‍රමයක්වන ග්‍රහ පන්ති කවි පිළිබඳ විස්තර කරන්න.
    iii. රිද්දි බිසවගේ චරිත නිරූපණ අවස්ථාව තීව්‍ර කිරීමට නානුමුරයේ කවි යොදාගන්නා බව ගායනා දෙකක් නිදසුන් ලෙස ගෙන පැහැදිලි කරන්න.

05. නර්තනයේ ප්‍රාසාංගික බව තීව්‍ර කිරීමෙහිලා සංගීතයෙන් ඉමහත් පිටුවහලක් ලැබේ.
    i. ශාන්ති කර්මවල අන්තර්ගත දේශීය ජන සංගීතය පිළිබඳ විමසුමක් කරන්න.
    ii. ඉහත ප්‍රකාශය අනුව ප්‍රාසාංගික නර්තන කලාව කෙරෙහි සංගීතය බලපා ඇති ආකාරය නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න.
    iii. නව සංගීත නිර්මාණකරණයෙහිලා ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රධාය හා සබැඳි ගායන, වාදන, පිටුවහලක් වී ඇති ආකාරය විස්තර කරන්න.

III කොටස

06. බෙරය සිංහල බෞද්ධ ජනතාවගේ පාරම්පරික සමාජය හා සංස්කෘතික ජීවිතයේ සෑම අංගයක් කෙරෙහිම ව්‍යාප්ත වූ තූර්ය භාණ්ඩයකි.
    i. බෙර සකස් කිරීමේදී ඒ හා බැඳි චාරිත්‍ර වාරිත්‍රවලදී පූජාර්ථය පිළිබිඹු කරයි. විස්තර කරන්න.
    ii. තම්මැට්ටමෙහි ව්‍යුහය හා එය සකස් කර ගැනීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ විමසුමක් කරන්න.
    iii. සම්මත මිණුම් හා ශිල්ප ක්‍රම භාවිත කරමින් පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්හි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නිර්මාණය කර ඇති අයුරු පැහැදිලි කරන්න.

07. අද්‍යතනයේ අංග රචනය විෂය වෘත්තීය වශයෙන් හා මාධ්‍ය වශයෙන්ද විශාල ලෙස ව්‍යාප්තවීමක් දක්නට ලැබේ.
    i. සරල අංග රචනා කට්ටලයක් සකස් කර ගැනීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
    ii. නූතන අංග රචනා ක්‍රම පිළිබඳ විමසුමක් කරන්න.
    iii. චේදිකා නාට්‍යවල විවිධ චරිත අංග රචනය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ විග්‍රහයක් කරන්න.

08. සංස්කෘතික සාරධර්ම අගයන උසස් රසඥතාවයකින් පිරිපුන් පුරවැසියකු බිහිවීමට කලාව බෙහෙවින් ඉවහල් වේ.
    i. සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට ඇතුලත් කිරීම සහ එහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.
    ii. නූතන නර්තන ප්‍රසංග චේදිකාව හා නර්තනාංග තුලින් සංස්කෘතික සාරධර්ම සුරැකේ ද ? විමසන්න.
    iii. රූපවාහිනී ප්‍රසාංගික කලාව මඟින් පුද්ගල රසඥතා වර්ධනයට පිටුවහලක් ලැබේ ද ? ඇගයීමක් කරන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමු වාර පරීක්ෂණය - 2019

12 ශ්‍රේණිය	නර්තනය I	පිළිතුරු පත්‍රය

I කොටස

1. 2	6. 4	11. 1	16. 4	21. 1
2. 1	7. 1	12. 4	17. 5	22. 3
3. 3	8. 5	13. 2	18. 2	23. 2
4. 5	9. 3	14. 3	19. 3	24. 5
5. 2	10. 2	15. 1	20. 4	25. 4

26. අත්මිණිය
27. සමගුණ
28. පහතරට / දෙවොල්...
29. හඬ ඉර
30. මුදියන්සේ දිසානායක මහතා
31. අංගුලියා පදය
32. දොළහ පෙළපාලිය
33. සවරම
34. මාත්‍රා 3+3
35. ඔලී
36. 1. ආසුව 2. පතහ විස්ස
37. 1. මස්කරා 2. ටූත් එනමල්
38. 1. අල්ලියාදු කුඩු 2. පහන් දැලි, කපුරු භාවිතයෙන් ගන්නා දැලි
39. 1. වීරමුණ්ඩ දෙවි 2. පොල් මල
40. 1. කුවේණි අස්න 2. මැදුම් තනිතිත
41. 1. වෙස් ඇඳුම් කට්ටලය 2. සිවිලිය
42. 1. මාවනැල්ල අසළ 2. අළුත් නුවර දේවාලය අසල
43. 1. වට්ටම - කුදාංත ගත දොං 2. තාල රූපය - මාත්‍රා 2+2+4
44. 1. රොබට් නොක්ස් - මහනුවර යුගය 2. ඉබන් බතූතා - ගම්පළ යුගය
45. 1. ශාන්ති කර්මය - කොහොඹා කංකාරිය 2. නර්තන අංගය - මඩුපුරය නැටීම
46. 1. කුලු නැටුම 2. ගොයම් නැටුම
47. 1. නාට්‍ය ශාස්ත්‍රය - භරත මුණිවරයා 2. අභිනය දර්පණය - නන්දි කේශ්වර
48. 1. පහතරට 2. සබරගමු
49. 1. වීර - උත්සාහ 2. රෞද්‍ර - ක්‍රෝධ
50. 1. චලනය 2. ශබ්ද හා නාද

II පත්‍රය - I කොටස

01. i.

1 2	1 2	1 2	1 2 3 4	1 2 3 4
ඉකුතු -	නා නු	දොතු -	ජීම - නා නා	නා ටි නා ට


සංකේත භාවිතයට - ල. 02
බෙරපදය නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ල. 04
ල. 06

ii.

1 2 3	1 2 3	1 2 3	1 2 3
කි රි ව	න ගෙ න	ඒ සූ -	- - -
නැ ගෙ ම්හ්	- ගො ලෙ	සා - -	- - -
නි රි බ	ර ඉ ඹු	ලේ - -	- - -
කු රු ල්	න නි මෙ	සා - -	- - -

සංකේත භාවිතයට - ල. 02
කවි පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ල. 04
ල. 06

iii.



සංකේත භාවිතයට - ල. 02
අඩවිව නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ල. 06
ල. 08
(මුළු ලකුණු 20)

02. i. නර්තන කලාවේ ප්‍රභවයට බලපෑ ජීව විද්‍යාත්මක සාධක පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
* ජීව විද්‍යාත්මක යන්න පැහැදිලි කර තිබීම.
* චලනය චිත්ත වේගයකට දක්වනු ලබන ප්‍රතික්‍රියාවක් බව.
* උදා :- සතුටක් ඇති වූ විට නිරායාසයෙන් උඩ පැනීම, ක්‍රෝධයක් ඇතිවූ විට මුහුණේ මස් පිඩු චලනය වීම, දෙතොල් වෙව්ලීම, නොසන්සුන් ඉරියව් ප්‍රදර්ශනයවීම යනාදිය දක්වා තිබීම.
* නර්තනය නරඹන්නන් තුළද සුවිශේෂ ශාරීරික කම්පනයක් ඇතිවන බව.
* ඔවුන් ද නර්තනයේ යෙදෙන්නා අනුව අත්පා මඟින් තාල තැබීමෙන් නර්තනයට සහභාගී වන බව.
* චිත්තවේග ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් චලනය උපයෝගී කරගන්නා බව.

යනාදී ලෙස කරුණු දක්වා නර්තන කලාවේ ප්‍රභවයට බලපෑ ආකාරය පැහැදිලි කර ඇත්නම් ල. 06

ii. ආගමික වශයෙන් මානව අවශ්‍යතා සඳහා
* ස්වභාවික වස්තූන්ට වැඳුම් පිඳුම් කිරීම සඳහා නර්තනය යොදාගත් බව.
* භාරතීය වෛදික සංස්කෘතියක්, බටහිර රටවල කතෝලික පසුබිමක්, විජයාවතරණය හා සම්බන්ධ බෞද්ධාගමික පසුබිමක් සමඟ නර්තනය සම්බන්ධ වූ බව.
* නර්තනයේ ප්‍රභවය විනෝදාර්ථයට වඩා පූජාර්ථය අරමුණු කරගත් බව.
* දේව පූජා සඳහා ද නර්තනය යොදාගත් බව. යනාදී කරුණු විස්තර කිරීමට. ල. 06

iii. සාමාජීය අවශ්‍යතා සඳහා
* ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ මූලික අවශ්‍යතාවයන් සපුරාලීම නර්තනයේ ප්‍රධාන අරමුණු වූ බව.
* විනෝදාර්ථයට වඩා පූජාර්ථය අරමුණ කොටගත් බව.
* අභිචාර විධි හා පුද පූජාවල නර්තනය, සමාරෝපය අනුකරණය බෙහෙවින් දක්නට ලැබෙන බව.
* සමාජය හා සම්බන්ධ විවිධ උත්සවවලදී (තාරුණ්‍යට පත්වීම, විවාහ උත්සව, අවමංගල්‍ය චාරිත්‍ර)
* ග්‍රෝතික අවධියේ යුද්ධමය අවස්ථා සඳහා නර්තනය භාවිතා කල බව යනාදි කරුණු 04ක් විස්තර කිරීමට. ල. 08

II කොටස

03. සමාජයේ යහ පැවැත්ම උදෙසා විවිධ වූ අරමුණු මුදුන් පමුණුවා ගැනීමට ශාන්ති කර්ම පවත්වනු ලැබේ.

i. වලියක් මංගල්‍යය පැවැත්වීමේ පරමාර්ථ පිළිබඳ විමසුමක් කරන්න.
* මහනුවර දළදා පෙරහැරේ දිය කැපීම අවසන් කළ පසු දෙවියන්ට පින් අනුමෝදනා කරවීම පිණිසත්,
* කිසිඳු බාහිර හෝ අභ්‍යන්තර හෝ උපද්‍රවයකින් තොරව පෙරහැර පැවැත්වීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ නිලමේවරුන් දළදා මාලිගාවේ පිට කට්ටලේ, ඇතුළු කට්ටලේ පෙරහැර නැරඹූ හා ආධාර උපකාර කළ පිරිස මෙන්ම පෙරහැරේ ගමන් ගත් අලි ඇතුන්ටත් වස් දොස් දුරුකර ආශීර්වාදය පතා පවත්වන බව.
* වලියකුන් ප්‍රධාන දෙවියන් හා යකුන් විෂයෙහි පූජා දොළ පිදේනි සත්දින වලියක් මංගල්‍ය පවත්වන බව.

ii. එම ශාන්ති කර්මය හා සබැඳි සැරසිලි අවස්ථා දෙකක් පිළිබඳ විස්තර කරන්න.
* සොළොස් මගළ නම් සැරසිල්ල පිළිබඳ විස්තර කිරීම.
* මුවමල/ ගවර මල සැරසිල්ල පිළිබඳ විස්තර කිරීම. ල. 06

iii. සමාජ සම්බන්ධතා හා සාරධර්ම එදිනෙදා ජීවිතය බැඳෙන ආකාරය වලියකුම ශාන්තිකර්මය ඇසුරෙන් පැහැදිලි කරන්න.
* කරදරයකට පත්වූ විට එයට උදව් කිරීම හා ඊට ප්‍රති උපකාර වශයෙන් වරම් ලබාදීම ආදී සාරධර්ම පුරාවෘත්ත කථාව තුළින් ලියා තිබීම.
* සහභාගී වූ සියල්ලගේම වස් දොස් දුරු කිරීම තුළින් සමාජ සහජීවනය උදෙසා සිදුවන කටයුත්තක් ලෙස පෙන්වාදීම.
* දළදා මාළිගාවේ තේමාවන් හා සම්බන්ධව චාරිත්‍ර විධි පැවැත්වීම පෙන්වාදීම.
* විෂ්ණු දේවාලය වැනි පූජනීය ස්ථානවල ආගමික සම්බන්ධතාවය තුළින් පවත්වාගෙන යන බව.
* විනෝදාස්වාදයට වඩා පූජාර්ථය අරමුණු කොට පැවැත්වෙන බව.
* දින 07ක් මස් මාංශ හා කිළිකුණු වලින් වැලකී සිටින බව.
* කුල පරම්පරාගත අය මෙන්ම ආලත්ති අම්මාවරුන් මේ සඳහා සහභාගී වීම. ල. 08

ආදි කරුණු තුලින් පිළිතුර ලියා තිබීම. (මුළු ලකුණු 20)

04. දේශීය ශාන්ති කර්ම ගායන, වාදන, නර්තන අංග වලින් පරිපූර්ණ වේ.

i. කොහොඹා කංකාරියේ ගායනා සහිත නර්තන අංග තුනක් නම් කර එක් නර්තන අංගයක් පිළිබඳ විමසුමක් කරන්න.

* කුවේනි අස්න, කොහොඹා හැල්ල, මඩුපුරය නැටීම ආදී නර්තන අංග 03ක් නම් කිරීමට. ල. 03
* ගායනය සහිත එක් නර්තන අංගයක් විස්තර කිරීමට. ල. 03

(මුළු ලකුණු 06)

ii. බලි ශාන්ති කර්මයට අයත් සුවිශේෂ ගායනා ක්‍රමයක් පිළිබඳ විස්තර කරන්න.

* ග්‍රහ පන්ති කවි.
* ජන්ම පත්‍රයෙහි ග්‍රහ පිහිටීම අනුව පුද්ගලයාට බලපා ඇති අශුභ ඵල සාර්ථක කර ගැනීම උදෙසා නව ග්‍රහයින් උදෙසා ගායනා කර සෙත් ශාන්තියක් ලබාගැනීමේ අරමුණින් මෙම කවි ගායනා කරන බව.
* උඩරට, පහතරට, සබරගමු යන සම්ප්‍රදායයන් ත්‍රිත්වයෙහිම බල ශාන්ති කර්මය දැකිය හැකි බව.
* බලි ශාන්තිකර්මයේදී ගායනයට මුල්තැන දෙන බව.
* ග්‍රහයින්ගේ වර්ණය, වාහනය, විමානය, භෝජන පිළිබඳ කරුණු තුනක්වත් විස්තර කිරීමට. ල. 06

iii. රිද්දි බිසවගේ චරිත නිරූපණ අවස්ථා තීව්‍ර කිරීමටම යොදාගෙන ඇති ආකාරය නානුමුරය කවි ඇසුරින් පැහැදිලි කරන්න.

* ශ්‍රී ලාංකේය ශාන්තිකර්ම අතර එන පහතරට රිද්දියාගයේ නානුමුරයේදී රිද්දි බිසවගේ චරිත නිරූපණ අවස්ථා තීව්‍ර කිරීමට, සුවිශේෂ වූ නර්තන, වාදන හා ගායනා යොදා ගැනෙන බව.
* එම නම් වලින් රිද්දි බිසව දිය නා සළු පිළි පැළඳ සූදානම්වන ආකාරය විස්තර කෙරෙන බව.
* ශෘංගාර රසය මතුවන සේ ගායනය කිරීම සුවිශේෂී බව.
* උදා :- රන්විල රිද්දි .....
  රේණු දොඩම් ..... ආදී කවි තුළින් විස්තර කර තිබීම. ල. 08

(මුළු ලකුණු 20)

05. i. ශාන්ති කර්මවල අන්තර්ගත දේශීය ජන සංගීතය

* දේශීය ජන සංගීතය පිළිබඳ විස්තර කිරීම.
* දේශීය ප්‍රධාන ශාන්තිකර්මවල නර්තන, ගායන හා වාදන සමඟ ගොඩ නැඟී ඇති බව.
* එම ගායනා විවිධ ස්වර සංකලන වලින් හා නාද රටාවලින් පෝෂිත බව.
* ශාන්ති කර්ම ගායනා විවිධ බව. ආඝාත්මක, අනාඝාත්මක ගායනා, සමාජ විවරණ ගායනා තුලින් විස්තර කර තිබීම.
* ශාන්ති කර්ම වලදී භාවිතවන ගායනා සඳහා වාදන භාණ්ඩ යොදාගන ඇති බව.
* ශාන්තිකර්මවල භාවිතා කරන නර්තන වලදී ජන සංගීතය වඩාත් ඉවහල්වන බව.
* සරල තාල රූප හා බැඳී ඇති බව.
* විවිධ වූ නාදමාලා යොදාගන ඇති බව. යනාදී කරුණු තුළින් පිළිතුර ලියා තිබීම. ල. 06

ii. ප්‍රාසාංගික නර්තන කලාව කෙරෙහි සංගීතය බලපා ඇති බව.

* ප්‍රාසාංගික නර්තන සාම්ප්‍රදායික නර්තන ඇසුරින් බිහිවන බව.
* විවිධ ස්වර සංකලනයන්ට අනුව එම නර්තන අංග නිර්මාණය කර ගන්නා බව (නිදසුන් සහිතව ලියා තිබීම)
* දේශීය, ඉගි නළු, නෘත්‍ය නාටක, ගීත නාටක ආදී අංග සඳහා සංගීතය යොදා ගන්නා බව.
* සංගීත ප්‍රසංග වලදී ද නර්තනය යොදා ගන්නා බව.
* විවිධ උත්සවවලදී ඉදිරිපත් කරන නර්තන අංග සඳහා සංගීතය යොදා ගන්නා බව හා ඒතුලින් ප්‍රාසාංගික බව ඇතිවන බව.
* භාරතීය හා බටහිර සංගීත ආභාෂය ලත් බව ල. 06

iii. නව සංගීත නිර්මාණ කරණයෙහිලා ලාංකීය නර්තන සම්ප්‍රදාය හා සබැඳි ගායන, වාදන පිටුවහලක් වී ඇති ආකාරය.

* සංගීත නිර්මාණයට දේශීය අවනද්ධ භාණ්ඩ යොදාගත් බව.
* ඉන්දියානු, බටහිර වාද්‍ය භාණ්ඩ (තත් වාද්‍ය භාණ්ඩ) සංයෝජනය කරගෙන ඇති බව.
* නර්තන සම්ප්‍රදායන් හා සම්බන්ධ අවනද්ධ වාද්‍ය භාණ්ඩ ශුෂිර වාද්‍ය භාණ්ඩ සමඟ සම්මිශ්‍රණය වී ඇති බව.
* ගායනය සහ බෙරපද කාණ්ඩ කීම.
* ප්‍රාසාංගික ගායන සඳහා දේශීය සම්ප්‍රදායවල ගායනා යොදාගෙන ඇති බව.
  නිදසුන් :- වන්නම් ගායනා, නමස්කාර ගායනා, ප්‍රශස්ති ගායනා ආදී.... කරුණු තුලින් විස්තර කර ලියා තිබීම. ල. 08

(මුළු ලකුණු 20)

III කොටස

06. i. බෙර සකස් කිරීමේදී ඒ හා බැඳි චාරිත්‍රවාරිත්‍රවලදී පූජාර්ථය පිළිබිඹු කරයි. නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

* බෙර සකස් කිරීමේදී පූජනීය වස්තුවක් ලෙස සලකා ඇති බව.
* බෙර සකස් කිරීමේදී ප්‍රථමයෙන් ගසක් තෝරා ගැනීම.
* ගස පිහිටි ස්ථානය පිළිබඳ සැලකිලිමත්වීම.
* ගස කැපීමට පෙර ගසමුල පිරිසිදු කොට ගසවටා මල්පැල හතරක් සිටුවා ගොප් රැහැන් ඇඳ කහ දියර ඉස සුවඳ දුම් දී මල්පහන් පුදන බව.
* ගසට අරක්ගත් දෙවියෙක් සිටීනම් ඉන් ඉවත්වන ලෙස කන්නලව් කිරීම සිදුකරන බව.
* සුබ නැකතට අනුව ගසේ කඳට පහරක් ගස නමස්කාර කොට ගස කපන බව.
* නක්ෂත්‍ර නියමයන් අනුව උතුරුඅළ, ප්‍රනාවස නැකතින් ගස කැපීමද හෙණ යෝගයෙන් භාණ්ඩයට නම් යෙදීම සම්මත සිරිත් බව යනාදි කරුණු ඇසුරින් පූජාර්ථය පිළිබඳ නිදසුන් දක්වා පැහැදිලි කර ඇත්නම් ල. 06

ii. තම්මැට්ටමෙහි ව්‍යුහය සහ සකස් කිරීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ විමසුමක් කරන්න.

* තම්මැට්ටම පොකුරු බෙරය නාමයෙන්ද හඳුන්වන බව.
* කඩිප්පු දෙකකින් වාදනය කරන නිසා විතත වර්ගයට අයත් බව.
* තම්මැට්ටම අසමාන බද දෙකකින් යුක්ත බව.
* එම කොටස් දෙක හඬබෑය / අඬබෑය සහ මණ්ඩම වශයෙන් හඳුන්වන බව.
* මණ්ඩම හඬබෑයට වඩා මඳක් විශාලව නිර්මාණය කරන බව.
* සකස්කිරීමේදී ඇහැළ, කොහොඹ, වරකා, ගංසූරිය වැනි දැව ලී වර්ග යොදා ගන්නා බව.
* මණ්ඩම සඳහා ඝනකමින් වැඩි හරක් හම්ද, හඬබෑය සඳහා ඝනකමින් අඩු හරක් හම්ද යොදා ගන්නා බව.
* වරපට සඳහා අඟල් $\frac{1}{2}$ පමණ හරක් හම්ද, හඬබෑය සඳහා ඝනකමින් අඩු හරක් හම්ද යොදා ගන්නා බව.
* ගැටිවැල සඳහා රතඹලා, රදලිය, කිරිඳිවැල්, මල්කැර, කැප්පිටියා කෝටු භාවිතා කරන බව.
* කුණ්ඩලම්පල්ල සඳහා පුවක්, කිතුල් ලී හෝ ලෝහ පතුරු යොදාගන්නා බව.

ව්‍යුහය පිළිබඳ හැඳින්වීමකට - ල. 04
අමුද්‍රව්‍ය හැඳින්වීමකට - ල. 04

iii. * සම්මත මිණුම් හා ශිල්ප ක්‍රම භාවිතා කරමින් පහතරතට සබරගමු නර්තන සම්ප්‍රදායන්හි ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නිර්මාණයකර ඇති අයුරු විස්තර කරන්න.

පහතරට බෙරය

* පහතරට බෙරය දෙවොල් බෙරය, යක් බෙරය, දික් බෙරය, රුහුණු බෙරය, මිහිඟු බෙරය, කිඳුරු බෙරය ආදී නම්වලින් හඳුන්වන බව.
* පහතරට බෙරය සෑදීම සඳහා ඇසළ, කොහොඹ, වරකා, ගන්සූරිය, මිල්ල ආදී දැව කඳන් මෙන්ම කිතුල්, පොල්, තල් ආදී තාල වර්ගයේ ගස්වල කඳන් බෙර නිර්මාණය සඳහා යොදාගෙන ඇති බවත් මිල්ල කඳ වඩාත් යෝග්‍ය බව දක්වා තිබීම.
* වරපට සඳහා - හරක් හම්
  කැපුම්හම, වෙනිවර - හරක් හම්, මුවහම්
  බෙර දෙඇස - හරක් බොක්ක (සිවිය)
  ගැටිවැල් සැකසීම - රදලිය, කිරිඳිවැල්, රත්මල්, මල්කුර, වේවැල් මෙන්ම හරක් නම්වලින් කපාගන්නා ලද සිහින් පටි භාවිතා කරන බව.
* බෙර සකස් කිරීමේදී අනුගමනය කරන ශිල්ප ක්‍රම ලෙස බෙරකඳ දිග, බෙර ඇස් විශ්කම්භය, බෙරකට ඝනකම, වරපට දිග හා බෙරය සකස් කිරීමේ අනුපිළිවෙල දක්වා තිබීම. ල. 04

සබරගමු වාද්‍ය භාණ්ඩය

* දවුල ලෙස හඳුන්වා තිබීම. * සිලින්ඩරාකාර හැඩය ඇති බව.
* දවුල කඳ සඳහා රන් ඇහැළ, කළු ඇහැළ, කොහොඹ, සඳුන්, වරකා, කිතුල් දැව භාවිතා කරන බව.
* දවුල් තට්ටුව සඳහා එළ හරක් හම්, මුව හම්, එළු හම් භාවිතා කරන බව.
* කඩිප්පුව සඳහා ඇට්ටෙරියා වැනි ලී වර්ග භාවිතා බව.
* දවුල් සකස් කිරීමේදී අනුගමනය කරන මිනුම් හා ශිල්ප ක්‍රම හා දවුල සකස් කිරීමේ පියවර නිර්මාණය කර ඇති ආකාරය පිළිබඳ විස්තර කර තිබේනම්. ල. 04

(මුළු ලකුණු 20)

07. i. සරල අංග රචනා කට්ටලයක් සකස් කර ගැනීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

* ෆවුන්ඩේෂන් කලර්ස් - පදනම් වර්ණ ආලේපන.
* ෂේඩින් කලර්ස් - දීප්ත හා ජාසින වර්ණවලින් යුක්ත බව.
* හයිලයිට් කලර්ස් - මුහුණේ උපාංගවල ත්‍රිමාණ ලක්ෂණ මතුකර දැක්වීමට යොදාගන්නා බව.
* කලර් හෙයා ස්ප්‍රේ - කේශවර්ණ ආලේප
* තොල් ආලේපන - විවිධ වර්ණයන්ගෙන් ලබාගත හැක.
* ලිප් ලයිනර් පෙන්සිල් - තොල් වටා හඬ ඇඳීම පිණිස රතු දුඹුරු කළු වර්ණයෙන් යුක්ත.
* ලිප් ග්ලෝස් - තොල්වල වියලි බව ඉවත්කර දීප්තිමත් කිරීමට.
* අයි ලයිනර් - ඇස් වටා හැඩ ඇඳීමට.
* අයි ලෑෂස් - කෘත්‍රිම ඇස් පිහාටු යනාදි ලෙස ද්‍රව්‍ය නම්කර ඇත්නම්. (ල. 06)

ii. ඉහත පාඨයට අනුව නූතන අංග රචනා ක්‍රම පිළිබඳ විමසුමක් කරන්න.

* තාක්ෂණයේ දියුණුවත් සමඟ අංග රචනා ද්‍රව්‍ය නිෂ්පාදනය හා නව ක්‍රමවේද සොයා ගනිමින් පවතී. ඒ අනුව නවීන අංග රචනා ක්‍රම දෙකකි.

i. Air Brush (ඒයාර් බ්‍රෂ්)

කොම්ප්‍රෙෂරයක් මඟින් නිකුත්වන වායු පීඩනය මුල්කර ගනිමින් දියර වශයෙන් පවත්නා (Foundation) තුනී වාෂ්ප පටලයක් ලෙස මුදා හරිමින් ශරීරය මත ආලේපනය කිරීම.

ii. Prosthetic (ප්‍රොස්තටික් මේක්අප්)

ප්‍රොස්තටික් නම් දියරයක් භාවිතා කරමින් සාදාගන්නා ලද මූලික හැඩවලින් ලබාගන්නා කොටස් මුහුණට හෝ ශරීරයට හෝ (බාහිර වශයෙන්) එකතු කිරීම තාක්ෂණික විධික්‍රම භාවිතයෙන් සිදුකිරීම් යන ක්‍රම දෙක පිළිබඳ හඳුන්වා එය භාවිතයේ පවතින ආකාරය පිළිබඳ විස්තර කර ඇත්නම් (ල. 06)

iii. වේදිකා නාට්‍යවල විවිධ චරිත අංග රචනය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ විමසුමක් කරන්න.
අංග රචනා ශිල්පියා විසින් නාට්‍යයක අංග රචනා කිරීමට පෙර අධ්‍යයනය කළයුතු පියවර කීපයකි.

* පිටපත මනා ලෙස අධ්‍යයනය කිරීම.
* ශෛලිය අවබෝධ කර ගැනීම.
* චරිතය පිළිබඳ මනා අවබෝධය (වයස, ස්ත්‍රී පුරුෂ භාවය)
* අනෙකුත් අනුශාංගික ශිල්ප සමඟ ගැලපීම සහ අවබෝධය
* පුහුණුවීම් මනා ලෙස අධ්‍යයනය කිරීම.
* යුගය, කාලය, ආගමික පසුබිම, සාමාජීය තත්ත්වය දේශපාලන ස්භාවය ආදිය පිළිබඳ වටහාගත යුතු බව.
* චරිතයන්හි බාහිර හා අභ්‍යන්තර ගති ස්වභාවය
* ද්‍රව්‍ය වර්ණ සහ ආලෝක වර්ණ ගැලපීම යනාදී.... කරුණු විස්තර කර ඇත්නම් (ල. 8)

(මුළු ලකුණු 20)

08. i. සාම්ප්‍රදායික නර්තනය සෞන්දර්ය විෂයක් වශයෙන් පාසල් අධ්‍යාපනයට එක් කිරීම සහ එහි ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

* සාම්ප්‍රදායික නර්තනයේ විධිමත් ලක්ෂණ ඉස්මතුවී සංස්කෘතිය සාර්ධර්ම ආරක්ෂා වී ඇති බව.
* නව නිර්මාණ බිහිවීම හා එහි ප්‍රවර්ධනය සිදුවී ඇති බව.
* පර්යේෂණාත්මක ග්‍රන්ථ බිහිවීම.
* ග්‍රන්ථකරණයට යොමුවීම හා අධ්‍යාපන අවස්ථා පුළුල්වී ඇති බව.
* දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය වන බව.
* රස චින්දනයට යොමුවීම. (ල. 06)

ii. * නූතන නර්තන ප්‍රසංග වේදිකාව හා නර්තනාංග තුළින් සංස්කෘතික සාර්ධර්ම සුරැකේ ද? විමසන්න.
* නූතන නර්තන ප්‍රසංග වේදිකාව හා නර්තනාංගවල සාර්ධර්ම රැකී ඇත්දැයි විස්තර කර තිබීම.
* සංස්කෘතික සාරධර්ම ගිලිහීම නිසා උසස් රසඥතාවයකින් යුත් නිර්මාණ බිහිවීම අවම වී ඇති බව.
* නර්තන නිර්මාණයන්හි කලාත්මක බව ආරක්ෂාවීමට උසස් නිර්මාණ කෘති අගය කිරීම යනාදි කරුණු ලියා ඇත්නම් (ල. 06)

iii. * රූපවාහිනී ප්‍රසාංගික කලාව මඟින් පුද්ගල රසඥතා වර්ධනයට පිටුවහලක් ලැබේද ? ඇගයීමක් කරන්න.
* රූපවාහනී නාලිකා මඟින් ඉදිරිපත් කෙරෙන රංගන වැඩසටහන් නම්කර ඇත්නම්
* රසඥතා වර්ධනයට සුදුසු නිර්මාණ බිහිවී ඇත්දැයි විස්තර කර තබීම.
* සංගීතය, ගීතය, වාද්‍ය භාණ්ඩ සංකලනය.
* පසුතල නිර්මාණය, වේදිකා ආලෝකය වර්ණවත් බව.
* රංග වස්ත්‍රාභරණවල ඖචිත්‍යභාවය.
* දේශීය සංස්කෘතියට ගැලපීම. (ල. 08)

(මුළු ලකුණු 20)

LOL.lk
Learn Ordinary Level

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර



• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

Knowledge Bank Publications

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

071 777 4440